රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: **33/92**

මගේ අංකය: එස්කේ/X/21/(I)92,
**1992** දෙසැම්බර් මස **30** වෙනි ද,
කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ,
ඒකාබද්ධ සේවා අංශයේ දී ය.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා දිසාපතිවරුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
හා ප්‍රාදේශීය ලේකම්වරුන්.

**<u>ගබඩා භාරකාර සේවයේ I වෙනි පන්තියට උසස් කිරීම - 1988</u>**

ගබඩා භාරකාර සේවයේ I වෙනි පන්තියේ 1988.12.31 වැනි දිනට ඇති පුරප්පාඩු ගබඩා භාරකාර සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයට අනුව. ගබඩා භාරකාර සේවයේ II 'අ' පන්තියේ දැනට සිටින සුදුසු නිලධාරීන් උසස් කිරීමෙන් පිරවීමට කටයුතු කරනු ලැබේ.

02. උසස් කිරීමට සුදුසුකම් ලැබීම පිණිස නිලධාරියකු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව හෝ ගබඩා භාරකාර සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 21 වැනි ඡේදයේ ප්‍රකාර ඉන් නිදහස් කරනු ලැබ හෝ සිටිය යුතුය.

03. උසස් කරනු ලැබීම සඳහා නිලධාරීන්ගේ සුදුසුකම් තක්සේරු කිරීම පිණිස දැනට II 'අ' පන්තියේ සිටින්නා වූ, 1976.12.31 දින හෝ ඊට පෙර, ගබඩා භාරකාර සේවයේ II පන්තියේ 'අ' ඛණ්ඩයට උසස් කරනු ලැබ ඇත්තා වූ ද, සියළුම සුදුසුකම් ලත් නිලධාරීන් සම්බන්ධයෙන් විශේෂ වාර්තා ලබාගැනීමට අවශ්‍ය වී තිබේ.

04. i. මෙම විශේෂ වාර්තා මේ සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් විය යුතුය. ආකෘති පත්‍රයේ I වන කොටස අදාල නිලධාරියාම සම්පූර්ණ කර දෙපාර්තමේන්තු ප්‍රධානියාට භාරදිය යුතුවේ. දෙපාර්තමේන්තු ප්‍රධානියා II කොටස නිසි පරිදි සම්පූර්ණ කොට පෞද්ගලිකවම සහතික කළ යුතුය.

ii. නිසි පරිදි සම්පූර්ණ කර සහතික කරන ලද විශේෂ වාර්තා 1993 ජනවාරි මස 31 වැනි දිනට පෙර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුය.

iii. සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා තාවකාලිකව මුදාහරින ලද සුදුසුකම් ඇති නිලධාරීන් ස්වකීය වාර්තා නිසි පරිදි සම්පූර්ණ කර අදාල ආයතන ප්‍රධානියාට භාරදිය යුතුවේ. එම ප්‍රධානීන් වාර්තාවේ II කොටස පෞද්ගලිකව සහතික කොට, වාර්තාව අදාළ බලධාරීන් මගින් ඉහත සඳහන් දිනට ප්‍රථම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

05. ඒකාබද්ධ සේවා අංශයට ලැබෙන සෑම විශේෂ වාර්තාවක්ම ලැබුණ බව දන්වනු ඇත. 1993 පෙබරවාරි මස 28 වැනි දිනට ප්‍රථම තම වාර්තාව ලද බවට දැනුම් දීමක් නොලබන නිලධාරීන් නොපමාව ඒ බව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත දැන්විය යුතුය.

06. මෙම චක්‍රලේඛ ලිපියේ අන්තර්ගත කරුණු ඔබේ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ සේවය කරන්නා වූ ද, ඔබ අමාත්‍යාංශය යටතේ ඇති සංස්ථා හා වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අදාල නිලධාරීන්ගේ ද, අවධානයට ලක් කරනු මැනවි.

අ.ක.: එම්.එන්.ජුනයිඩ්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

ඩබ්ලිව්.පී.එස්.ජයවර්ධන
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ.

**ගබඩා භාරකාර සේවයේ I වැනි පන්තියට උසස් කිරීම - 1988**
**විශේෂ වාර්තා**

I වැනි කොටස
(නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.)

01. නිලධාරියාගේ මුලකුරු සහිත නම :-
(අ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :-

---

02. උපන් දිනය :-

---

03. (අ) ගබඩා භාරකාර සේවයේ II ' අ '
පන්තියට පත් වූ දිනය :-

(ආ) 1989.01.01 දිනට වාර්ෂික
(ඒකාබද්ධ ) වැටුප හා එම
වැටුපට එළඹි දිනය :-

---

04. දැනට සේවය කරන දෙපාර්තමේන්තුව :-

(අ) එහි සේවා කාලය :-
(ආ) කාර්යාලයීය ලිපිනය :-

---

05. I. ග.භා.සේවා ව්‍යවස්ථාවේ 21 වැනි
ඡේදයේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම්
විභාගය ඔබ සම්පූර්ණ කර තිබේ ද ?

II. එසේ නම් සම්පූර්ණ කළ දිනය :-

III. ප්‍රතිඵල දැන් වූ ලිපියේ යොමුව :-
(අදාළ ලිපියේ ඡායාස්ථ පිටපතක් අමුණන්න.)

IV. විභාග ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටී නම්
අදාළ විස්තර :-
නැතහොත්;

V. ඔබ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන්
නිදහස් කර ඇත්නම් එය ක්‍රියාත්මක වූ
දිනය හා දැනුම් දුන් ලිපියේ යොමුව :-

---

06. 1989.01.01 දිනට පූර්වාසන්න පසු අවුරුදු
කාලය තුළ,

I. සියළුම වැටුප් වර්ධක ඔබ විසින්
උපයා ගෙන තිබේ ද?

II. ඔබ අවවාද කිරීම් හැර මොනයම් ආකාරයක හෝ දඬුවමක් / දඬුවම් ලබා තිබේ ද? එසේ නම්, එම දඬුවම් මොනවාදැයි සඳහන් කරන්න.

III. ඔබට විරුද්ධව අරඹන ලද විනය කටයුතු ඇත්නම්, ඒ පිළිබඳ වත්මන් තත්ත්වය දනම සහිතව දක්වන්න.

---

07. ඔබගේ සේවා කාලය තුළ දී **<u>මොනයම් අවස්ථාවක හෝ වංකභාවය</u>** පිළිබඳ ක්‍රියාවකට ඔබ දඬුවම් ලබා ඇත් ද? එසේනම් වරදේ ස්වභාවය, දෙනලද දඬුවම හා දඬුවම් කළ දිනය ආදී විස්තර සඳහන් කරන්න.

---

08. 06 වැනි සහ 07 වැනි කොටුවල සඳහන් කරුණු සම්බන්ධයෙන් ඔබට නිරීක්ෂණ කිසිවක් දැන්වීමට තිබේද?

---

09. ගබඩා භාරකාර සේවයේ I පන්තියට උසස්වීම් සඳහා වූ ඔබේ ඉල්ලීම සම්බන්ධයෙන් ඔබට ඉදිරිපත් කිරීමට විශේෂ සුදුසුකම් කිසිවක් ඇත්නම් සඳහන් කරන්න.

---

10. සංස්ථාවක හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා ඔබ දැනට මුදාහැර ඇත්නම් දින වකවානු සහිතව ඒ පිළිබඳ විස්තර දක්වන්න.

---

11. ඔබ ආයතන චක්‍රලේඛ 344 යටතේ වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ඇත්නම් දින වකවානු සහිතව විස්තර සඳහන් කරන්න.

---

12. ඉල්ලුම්කරුගේ ප්‍රකාශය :-

මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, දැන දැනම සැලකිය යුතු තොරතුරු කිසිවක් සඟවා නැති බවත්, මෙයින් සහතික කොට ප්‍රකාශ කරමි. මා විසින් සපයා ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය යයි සොයා ගනු ලැබුවහොත්, ගබඩා භාරකාර සේවයේ I පන්තියට උසස්වීම පිළිබඳව මාගේ හිමිකම් නොසලකා හැරීමට සහ මට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට මා යටත් බව ද මම දනිමි.

............................................
නිලධාරියාගේ අත්සන.

මා ඉදිරිපිට දී අත්සන් කරමි.

...............................................
සහතික කරන නිලධාරියාගේ අත්සන

සහ නිල නාමය.

දිනය:-
රාජකාරී ලිපිනය:-

**II වැනි කොටස**
**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.**

මෙම ආකෘති පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ තොරතුරු මගේ දෙපාර්තමේන්තුවේ **II 'අ'** පන්තියේ ගබඩා භාරකාර
මහතා / මිය / මෙනවිය ගේ සේවා වාර්තාව හා සසඳ බලන ලදුව, ඒවා එකඟ බව හා නිවැරදි ලෙසට පෙනී ගිය බව මෙයින් සහතික කරමි. මෙම නිලධාරියාට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ගයක් අරඹා ඇති අතර, එසේ කිරීමේ අදහසක් ද නැත.

ගබඩා භාරකාර සේවයේ I පන්තියට උසස් කරනු ලැබීමට ඔහු/ ඇය සෑම අයුරින්ම සුදුසු / නුසුදුසු බව නිර්දේශ කරමි.

...........................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

පදවි නාමය :-

ලිපිනය :-

---

දිනය :-

❖ නොගැලපෙන පාඨ මකා දමන්න.